**කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතියේ-02 කොටස - 2017**

---

කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතියේ-02 කොටසේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873 - එල්කේ දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

මූල්‍ය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතියේ 02 කොටස ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ කෘෂි ඵලදායිතාවය ඉහළ නැංවීමට, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමට සහ යාපනය, මුලතිව්, අනුරාධපුර, මඩකලපුව, මොණරාගල, මාතලේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල සුළු පරිමාණ ගොවීන්ගේ සහ කෘෂි ව්‍යාපාර මඟින් කෙරෙන අගය එකතු කිරීම වැඩි කිරීමට සහයවීම වේ. තවද, තරඟකාරී සහ අලෙවි කළ හැකි භාණ්ඩ නිෂ්පාදනයට සුළු පරිමාණ ගොවීන්ට සහයවීම, වෙළඳපොළ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ගේ හැකියාව වර්ධනයට සහයවීම සහ වානිජකරණය දෙසට යොමුවීමට සහයවීම කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහාවූ ව්‍යාපෘතියේ - 02 කොටස යටතේ සිදුකිරීමට අපේක්ෂා කෙරේ. මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,642.35 කට සමාන එජඩො මිලියන 64.23 ක් වූ අතර ඉන් රු.මිලියන 9,553.78 කට සමාන එජඩො මිලියන 63.64 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජූලි 24 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්රකාශනවල සමස්ත

ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක තැන්පතුව, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේද යන බව,

(එ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව, සහ

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

-------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා

සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක තැන්පතුව, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 චක්‍රලේඛයේ 09 වගන්තියේ අවශ්‍යතාවය අනුව, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල සුමට ක්‍රියාකාරිත්ව සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති පාලන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| ජා.සං.ස | 63.64 | 9,553.78 | 700 | 0.52 | 80.00 |
| ශ්‍රීලංර | 0.59 | 88.57 | 20 | 0.01 | 1.40 |
| එකතුව | **64.23** | **9,642.35** | **720** | **0.53** | **81.40** |

ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගැනීමට ව්‍යාපෘතියේ සමස්ථ කාලපරිච්ඡේදයට ආවරණය වන පරිදි මූල්‍ය හා භෞතික ඉලක්ක ඉස්මතු කරමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට අවශ්‍ය වුවද, ව්‍යාපෘතිය විසින් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. එම නිසා ව්‍යාපෘතියේ මූල්‍ය සැලැස්ම අනුව, 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කිරීමට අපේක්ෂා කළ මුළු වෙන්කිරීමෙන් සියයට 15.70 ක් නියෝජනය වන එ.ජ.ඩො. මිලියන 10 ක

වෙන්කිරීමෙන්, සමාලෝචිත වර්ෂය අවසානයේදී සියයට 0.80 ක් නියෝජනය වන එකතුව එ.ජ.ඩො. මිලියන 0.52 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද, අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද රු.මිලියන 720 ක වෙන්කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී සියයට 11.30 ක් නියෝජනය වන රු. මිලියන 81.40 පමණක් උපයෝජනය කර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ඇගයීම් ලියවිලි අනුව, ගොවීන් පුහුණු කිරීම හා ධාරිතා වර්ධනය, නවීන කෘෂිකාර්මික තාක්ෂණික උද්‍යාන, නිෂ්පාදන සහ අලෙවි යටිතල පහසුකම් සහ විශ්ලේෂණය සහ ප්‍රතිපත්තිය පිළිබඳ උපදෙස් සැපයීම යනාදී අනු සංරචක 04 කින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සමන්විත වේ. ලැබුණු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම, මූලික සමීක්ෂණය සඳහා උපදේශකයන් බඳවා ගැනීම සහ පද්ධති ඇගයීම හා ගොවීන්ගේ සංවිධාන ඇගයීම් යනාදී මූලික ක්‍රියාකාරකම් අනු සංරචක යටතේ ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දින වන විටත් ජාත්‍යන්තර කෘෂිකාර්මික තාක්ෂණික සේවා සපයන්නන් ලෙස විදේශීය උපදේශකයකු තෝරා ගෙන සේවය ලබාගැනීමට ව්‍යාපෘතියේ පරිපාලන අත්පොතෙහි 34 වගන්තිය අනුව ව්‍යාපෘතිය පියවර ගෙන නොතිබුණි. සේවා සපයන්නන්ගේ තෝරා ගැනීම සහ කාර්යසාධනය මත ව්‍යාපෘතියේ සියලුම ක්‍රියාකාරකම් නිර්මාණය සහ එම ක්‍රියාකාරකම්වල ආරම්භය රඳා පවතින බව නිරීක්ෂණය විය.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

ව්‍යාපෘතියේ කටයුතු 2017 ජනවාරි ආරම්භ කර තිබුණද, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක, ගණකාධිකාරීවරු, ප්‍රසම්පාදන නිලධාරි, අධීක්ෂණ සහ ඇගයීම් නිලධාරින්, සමාජ සංවර්ධන විශේෂඥයින්, ඉංජිනේරුවන් වැනි මූලික තනතුරුවල නිලධාරින් 2017 ජූලි බඳවා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතියේ කටයුතු වල භෞතික ප්‍රගතිය අඩු ප්‍රගතියක් පෙන්වීය.